ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය / எனது இல / My No. } MSL SD 5.9.5

දිනය / திகதி / Date } 2022.09.29

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## பேராதனைப் பல்கலைக்கழகம், இலங்கை
## UNIVERSITY OF PERADENIYA, SRI LANKA

විනයපාලක කාර්යාලය

දුරකථන අංක / தொலைபேசி இல / Telephone Nos. } +94812392423

ෆැක්ස් / தொலைநகல் / Fax } +94812388102

විද්‍යුත් තැපැල / ஈ மெயில் / E-mail } marshal@pdn.ac.lk


සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ දැනගැනිම සඳහා,

ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යයාව,

**<u>හන්තාන තරණය සඳහා පැමිණි යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ට පීඨය තුළ නවාතැන් සැපයීම</u>**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය වූ කලි ඉතාමත් ම රමණීය වටපිටාවකින් යුත් මනස්කාන්ත හන්තාන කඳුවැටිය හා මහවැලි ගඟෙන් මායිම්ව මිටියාවතක පිහිටි විශ්වවිද්‍යාලයකි. පීඨ නවයකින් සමන්විත මෙම විශ්වවිද්‍යාලය නේවාසිකාගාර රාශියක් හා තවත් බොහෝ පොදු පහසුකම් වලින් සමන්විත අධ්‍යයන, අනධ්‍යයන හා ශිෂ්‍ය ප්‍රජාව ඉතාමත් ම සහජීවනයෙන් යුතුව ජීවත්වන සිංහල, දමිළ, මුස්ලිම් සහ වෙනත් ජාතීන් මෙන්ම විදේශීය විශ්වවිද්‍යාල වලින් පැමිණි සිසුන්ද උපාධිය හදාරනු ලබන විශ්වවිද්‍යාලයකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය නැරඹීමට පාසල් සිසුන්, රටේ ජනතාව මෙන්ම දෙස් විදෙස් සංචාරකයන් මෙන්ම වෙනත් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යයාවන් ද පැමිණෙන දැනුම, විනෝදය හා බොහෝ අද්දැකීම් ලබාගන්නා තෝතැනන්කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය නැරඹීමට පැමිණෙන හෝ හන්තාන තරණය සඳහා පැමිණෙන කවර කණ්ඩායමක් වුවද ඊට අදාල අවශ්‍ය පහසුකමක් සැපයීම, මගපෙන්වීම, උදව් උපකාරයන් කිරිම අපගේ වගකීමක් හා යුතුකමක් ද වන බව අප සැමගේ පිළිගැනීමය.

නමුත් මෙම කටයුතු ඉටු කිරිමේදි මේ සම්බන්ධ සම්මුතින් හා සම්ප්‍රදායන් වලට එකගව හා බලධාරින්ගේ අනුමැතියට යටත්ව කටයුතු කිරිම ශිෂ්ඨ සම්පන්න සියලු දෙනාගේ වගකීමකි. නිතිගරුකව, නීතිරීති වලට යටත්ව තිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් කටයුතු කිරිමටත් පොදු නීතිරීති සම්ප්‍රදායන් කඩකිරිම් සිදු නොකර ඒවාට අවනතව කටයුතු කිරිමත් අපගේ සම්ප්‍රදායයි.

2022 සැප්තැම්බර් මස 10 වන දින යාපනය විශ්වවිද්‍යාලයෙන් පැමිණි සිසුන්ට අවශ්‍ය පහසුකම් සැපයිමේදි පීඨයේ ශිෂ්‍ය සංගම් වලට හා එය සංවිධානය කළ හා එය සම්බන්ධීකරණය සිදුකරන ලද සියලුදෙනා එම කටයුතු ඉටු නොකිරිම මත සියලු ම දෙනා අපහසුතාවයට පත්වන අයුරින් මෙම කටයුතු සිදුවි ඇත. කලින් සුදුසු ස්ථානයක් වෙන්කරගෙන ඊට අවශ්‍ය ලිඛිත අවසරය ලබාගෙන සෙසු පහසුකම් ඉටු කරනු ලැබුවානම් එම සිසුන්ට මීට වඩා පහසුකමක් භුක්තිවිදීමට හා පහසුකම් සැලසීමට හැකියාව තිබුණි. එම අවස්ථාවට අවශ්‍ය කටයුතු සිදුනොකර සිසු පිරිසකට නවාතැන් ගැනිමට අවශ්‍ය කිසිදු පහසුකමක් නොමැති පීඨ පොදු කාමරයේ (ආපනශාලා පරිශ්‍රයේ) නවාතැන් සැපයීම කිසිසේත්ම අනුමත කළ නොහැක. එසේම උක්ත කරුණු පැහැදිලි කරමින් එම අවස්ථාවේ පීඨාධිපතිනිය හා පීඨයේ නියෝජ්‍ය විනයපාලකවරයාගේ විසින් ලබාදුන් උපදෙස් හා නියෝග පිළිනොගෙන කටයුතු කිරිම කිසිසේත් අනුමත කළ නොහැක. තවද පිටස්තර විශ්වවිද්‍යාලයක ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පීඨ පරිශ්‍රයක නවාතැන් සැපයීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කිර්ති නාමයට ද කැලලකි. මෙම කටයුතු ඔබගේ අතපසුවීම් මත මගහැරී ගියේ නම් සහ එම හේතුව මත යාපනය විශ්වවිද්‍යාලයේ සිසුන්ට තිසි ස්ථානයක් වෙන්කිරිමට අවස්ථාව නොලැබීයාම පරිපාලනයේ දෝෂයක් හෝ දුර්වලතාවයක් ලෙස පීඨ ශිෂ්‍ය සංගමය විසින් හුවා දැක්වීම කිසිසේත්ම අනුමත කළ නොහැකිය. මෙම සිදුවීමේදි අදාල සිසුන් විසින් ද ඔවුන්ගෙන් හා මහා ශිෂ්‍ය සංගමයෙන් වූ අතපසුවීම සම්බන්ධයෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාදී ඇත.

කරුණු එසේහෙයින් මෙම සිදුවීම තුළින් පරිපාලනයේ අකාරුණික බව හෝ නෙසලකාහැරීම වැනි කරුණු ගෙනහැර දැක්වීම වෙනුවට ඒවායේ සම්පූර්ණ වගකීම මෙය සංවිධානය කළ හා සම්බන්ධීකරණය කළ සිසුන් විසින් බාරගතයුතු බව අවධාරණය කරමි.

මහාචාර්ය ටී.ඩබ්ලිව්.එම්.ටී.ඩබ්ලිව්. බණ්ඩාර
විනයපාලක
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

Prof. Thilak Bandara
Proctor
University of Peradeniya